மாதிரி (இலக்கம் 02)

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා - 487

ආයතනයේ නම - රාජ්‍ය සේවා කොමිෂන් සභාව

පාර්ලිමේන්තුවේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් සභාගත කරන ලද වාර්තා සම්බන්ධයෙන් ස්ථාවර නියෝග අංක 119 (4) යටතේ ගරු අමාත්‍ය වරයාගේ නිරීක්ෂණ හා ගනු ලබන පියවර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම.

பாராளுமன்ற வெளியீட்டுத் தொடர் இலக்கம் - 487

நிறுவனத்தின் பெயர் - பகிரங்க சேவை ஆணைக்குழு

பாராளுமன்றத்தின் அரச கணக்குக் குழுவினால் முன்வைக்கப்பட்ட அறிக்கை தொடர்பாக நிலையியற் கட்டளை இலக்கம் 119(4) இன் கீழ் கௌரவ அமைச்சரின் அவதானிப்புக்களையும் மற்றும் அது தொடர்பாக எடுக்கப்படும் நடவடிக்கைகளையும் பாராளுமன்றத்திற்கு சமர்ப்பித்தல்.

Parliamentary Series No - 487

Name of the institution - Public Service Commission

Submission of observations of the Hon. Minister and steps taken with regard to the reports tabled by the Committee on Public Accounts in terms of Standing Order No. 119 (4)

ආකෘති (අංක.01)

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා - 487

ආයතනයේ නම - රාජ්‍ය සේවා කොමිෂන් සභාව

	කාරක සභාවේ නිරීක්ෂණ හා නිර්දේශ	නිවැරදි කිරීමට ගත් පියවරයන් හා වර්තමාන තත්ත්වය
01	<u>රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ 2021 සහ 2022 වර්ෂවලට අදාළ වාර්ෂික වාර්තා</u> රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ 2021 සහ 2022 වර්ෂවලට අදාළ වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කර තිබුණද 2020 වර්ෂයෙන් පසු වාර්ෂික වාර්තා කොමිෂන් සභා නිල වෙබ් අඩවියට ඇතුළත් කර නොතිබීම පිළිබඳව කාරක සභාව නිරීක්ෂණය කළේය. ඉහත වාර්ෂික වාර්තා කොමිෂන් සභා නිල වෙබ් අඩවියට ඇතුළත් කිරීමට අතපසුවීමක් වී ඇති බවත් ඒවා උඩුගත කිරීමට කටයුතු කරන බවත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි) ප්‍රකාශ කළාය.	2024 වර්ෂය වන තෙක් කාර්යසාධන වාර්තාව රාජ්‍ය සේවා කොමිෂන් සභා නිල වෙබ් අඩවියට උඩුගත කර ඇත.
02	<u>2021 වර්ෂයේ විගණකාධිපති වාර්තාවේ නිරීක්ෂණ අනුව රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්යසාධන වාර්තාවෙන් කොමිෂන් සභාවේ කාර්යසාධනය මැනීමට ප්‍රමාණවත් කරුණු ඉදිරිපත් කර නොතිබීම</u> (i) කොමිෂන් සභාවේ ආයතන අංශය, විනය අංශය,පත්කිරීම් අංශය හා උසස් කිරීම් අංශය විසින් 2021 වර්ෂයේ සිදු කරන ලද කාර්යයන් සංඛ්‍යාව පමණක් කාර්යසාධන වාර්තාවේ ඇතුළත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂය තුළ අංශයට ලැබුණු පැමිණිලි (කාර්යයන්) සංඛ්‍යාව, එම පැමිණිලි තුළින් නිම කළ ප්‍රමාණය සහ තවදුරටත් ඉතිරිව පවතින ප්‍රමාණය යන තොරතුරු ඇතුළත් කර නොතිබුණි. ඒ අනුව,	(i) 2025 වර්ෂය සඳහා කාර්යසාධන වාර්තාව සකස් කිරීමේදී ස්ථාවර නියෝග අංක 42 අනුව එම තොරතුරු ද ඇතුලත් කොට සකස් කර ඇත. විගණනය වෙත කෙටුම්පත් කාර්යය සඳහා එසේ පිළියෙල කල කාර්යසාධන වාර්තාව ලබා දී ඇත.

	අදාළ වාර්තාව තුළ 2021 වර්ෂයේ කාර්යසාධන මට්ටම සලකා බැලීමට තරම් ප්‍රමාණවත් කරුණු ඇතුළත් කර නොතිබුණ බව සඳහන් විය. 2022 කාර්යසාධන වාර්තාවේ ද මෙලෙසම දක්වා ඇති බව කාරක සභාව හමුවේ අනාවරණය විය. 2023 වර්ෂයේ සැප්තැම්බර් මස සිට ඉදිරිපත් කරනු ලබන කාර්යසාධන වාර්තා වල කටයුතු අවසන් කළ පැමිණිලි සංඛ්‍යාව හා කටයුතු කරමින් පවතින පැමිණිලි සංඛ්‍යාව පිළිබඳ තොරතුරු වෙන් වෙන්ව ඇතුළත් කිරීමට කටයුතු කරමින් පවතින බව රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ පු.ග.නි ප්‍රකාශ කළාය.	
	(ii) සමාලෝචිත වර්ෂයේ අභියාචන අංශයට ලැබුණු අභියාචනා ප්‍රමාණය ප්‍රමාණාත්මකව දක්වා තිබුණද, නිරීක්ෂණ හා නිර්දේශ සහිත වාර්තා කැඳවූ අභියාචනා ගණන සහ කටයුතු නිම කළ අභියාචනා ප්‍රමාණය ඉදිරිපත් කිරීමේදී එය සමාලෝචිත වර්ෂයේ සහ පෙර වර්ෂයන්හි අභියාචනා ප්‍රමාණද ඇතුළත්ව ඉදිරිපත් කර තිබුණු බව (කාල විශ්ලේෂණයක් නොමැතිව) මෙහිදී සඳහන් විය. එම හේතුවෙන් එම අංශයේ සමාලෝචිත වර්ෂයේ කාර්යසාධන මට්ටම නිශ්චය කිරීමට ප්‍රමාණවත් තොරතුරු ඉදිරිපත් කර නොතිබුණ බවත් 2022 කාර්යසාධන වාර්තාවේද මෙලෙසම දක්වා ඇති බවත් කාරක සභාව හමුයේ අනාවරණය විය. පෙර වර්ෂයේ නොවැම්බර් හා දෙසැම්බර් මාසයන්හිදී ලැබෙන පැමිණිලි පිළිබඳ කටයුතු කිරීම සමාලෝචිත වර්ෂයේ ජනවාරි, පෙබරවාරි මාසයන්හිදී සිදු කරන බැවින් හා අභියාචනා සඳහා වාර්තා කැඳවන ආයතන	(ii) කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇති පැමිණිලි පිළිබඳව අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සඳහා කොමිෂන් සභාව මගින් කැඳවා ඇති වාර්තා සැපයීමට ප්‍රමාද වී ඇති ආයතන (අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු ආදී අනෙකුත් ආයතන/පුද්ගලයන්) ඇතුලත් වාර්තාව **PSC/ACC/R01/AUDIT/03/202** අංක දරණ **2024 පෙබරවාරි 22 දිනැති ලිපිය මගින් ඉදිරිපත් කර ඇත. එම වාර්තාව මේ සමග ඉදිරිපත් කරමි. (ඇමුණුම 01)**

	විසින් ඊට අදාළ නිසි ප්‍රතිචාර දැක්වීම ප්‍රමාද වීම තුළ මෙවැනි ගැටළු උද්ගත වන බව ප්‍ර.ග.නි ප්‍රකාශ කළාය. ආයතන විසින් පැමිණිලි සඳහා ප්‍රතිචාර නොදැක්වීම/ ප්‍රතිචාර දැක්වීමේ මන්දගාමී ස්වභාවය පිළිබඳව ජනාධිපති ලේකම්වරයා වෙත ලිඛිතව දැනුම් දී ඇති බව ද ප්‍ර.ග.නි ප්‍රකාශ කළේය. ආයතන විසින් පැමිණිලි සඳහා නිසි කාලය තුළ ප්‍රතිචාර නොදැක්වීම හේතුවෙන් අදාළ පැමිණිල්ල සිදු කරන පාර්ශවයන් අගතියට පත් වන බව නිරීක්ෂණය කළ කාරක සභාව ඒ පිළිබඳ කඩිනමින් ක්‍රියාමාර්ග ගැනීමේ වැදගත්කම කාරක සභාව අවධාරණය කළේය. **නිර්දේශ** මේ අනුව, වර්තමානය වන විට රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇති පැමිණිලි පිළිබඳව අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සඳහා කොමිෂන් සභාව මගින් කැඳවා ඇති වාර්තා සැපයීමට ප්‍රමාද වී ඇති ආයතන (අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු ආදී අනෙකුත් ආයතන/පුද්ගලයන්) ලැයිස්තුවක් ප්‍රමාද වී ඇති කාල වකවානු සහිතව 2024.02.22 දිනට පෙර කාරක සභාව වෙත ලබාදෙන ලෙස කාරක සභාව ප්‍ර.ග.නි වෙත නියෝග කළේය. රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් ගේ අංක PSC/ACC/R01/AUDIT/03/202 හා 2024 පෙබරවාරි 22 දිනැති ලිපිය මගින් අදාළ වාර්තාව ලබා දී ඇත.	
03	<u>අභ්‍යන්තර විගණනය</u> 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40 වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාවේ අභ්‍යන්තර විගණනය සිදු කිරීම සඳහා ප්‍රධාන ගණන්දීමේ නිලධාරි විසින් සුදුසු විගණකවරයකු පත් කළ යුතු වුවද කොමිෂන්	අභ්‍යන්තර විගණක තනතුරෙහි සේවය කරන ලද නිලධාරිනිය ඇයගේ අසනීප තත්වය මත ස්ථාන මාරු ලබා ගැනීම හේතුවෙන් 2023.10.03 දින සිට පුරප්පාඩු වී පැවති මෙම තනතුර සඳහා සුදුසු නිලධාරියකු පත්කරන ලෙස රාජ්‍ය පරිපාලන

	සභාවේ අභ්‍යන්තර විගණක තනතුර 2023 ඔක්තෝබර් 03 දින සිට පුරප්පපාඩුව පවතින බව කාරක සභාව නිරීක්ෂණය කළේය. කොමිෂන් සභාව සඳහා අභ්‍යන්තර විගණක වරයකු ලබා දෙන ලෙස රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයෙන් ඉල්ලීමක් කර ඇති බව ප්‍ර.ග.නි ප්‍රකාශ කළාය.	පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශ ලේකම් වෙත අවස්ථා කීපයකදී ඉල්ලීම් සිදු කරන ලද අතර ඒ අනුව 2025.07.17 දින සිට එම තනතුර සඳහා සුදුසු නිලධාරිනියක පත්කර ඇත.
04	<u>කාර්ය මණ්ඩල තොරතුරු</u> කොමිෂන් සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට අනුමත කාර්ය මණ්ඩලය 238 ක් වූ අතර තත්‍ය කාර්ය මණ්ඩලය 219 ක් වූයෙන් ජ්‍යෙෂ්ඨ මට්ටමේ 7ක් ද, තෘතීක මට්ටමේ 4ක් ද, ද්වීතිය මට්ටමේ 2 ක් ද හා ප්‍රාථමික මට්ටමේ 6 ක් ද ලෙස පුරප්පපාඩු 19 ක් පැවතුණි. තවද, සේවා අවශ්‍යතාවය සලකා බලා අත්‍යවශ්‍ය තනතුරුවල පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට හෝ කාර්ය මණ්ඩලය සංශෝධනය කර ගැනීමට කටයුතු කර නොමැති බව කාරක සභාව නිරීක්ෂණය කළේය. ජාතික පොලිස් කොමිෂන් සභාව ස්ථාපිත කිරීමෙන් පසු 2022 වර්ෂයේ දෙසැම්බර් මාසයේදී රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමත කාර්ය මණ්ඩලය සංශෝධනය කර අනුමත කර ගන්නා ලද බව ද බඳවා ගැනීම් අත්හිටුවා ඇති බැවින් පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට නොහැකි වී ඇති බවද ප්‍ර.ග.නි ප්‍රකාශ කළාය.	**ජ්‍යෙෂ්ඨ මට්ටම -** 2023.12.31 දින වන විට සහකාර ලේකම් තනතුරු 05ක්, අභ්‍යන්තර විගණක තනතුරු 01 ක් හා සහකාර අධ්‍යක්ෂ (තොරතුරු හා සන්නිවේදන) තනතුරු 01ක් ලෙස ජ්‍යෙෂ්ඨ මට්ටමේ පුරප්පාඩු 07 ක් පැවතුනි. සහකාර ලේකම් තනතුරෙහි පැවති පුරප්පාඩු නව බඳවා ගැනීම් තුලින් සම්පූර්ණ කර ගත් අතර මේ වන විට සහකාර ලේකම් තනතුරු 2ක් පුරප්පාඩුව පවතින නමුත් අධිකරණ හේතුවක් මත ශ්‍රී ලංකා පරිපාලන සේවයේ තනතුරට පත්කිරීම් ක්‍රියාත්මක නොවන බැවින් එම පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට නොහැකි වී ඇත. අභ්‍යන්තර විගණක තනතුර සඳහා මේ වන විට ඉහත අංක 03හි දක්වා ඇති ලෙස නිලධාරියකු පත් කර ඇත. සහකාර අධ්‍යක්ෂ (තොරතුරු හා සන්නිවේදන) තනතුර සඳහා මේ වන විට වැඩ බැලීමේ පදනම මත නිලධාරියකු පත්කර ගෙන ඇත. **තෘතීක මට්ටම -** 2023.12.31 වන විට තෘතීක මට්ටමේ තනතුරු 04ක් පුරප්පාඩුව පැවතුනි. එයින් සංඛ්‍යාලේඛන නි.ලධාරි තනතුරෙහි පුරප්පාඩුව සඳහා සුදුසු නිලධාරියකු ලබා දෙන ලෙස ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වෙතින් ඉල්ලීම් කර ඇත.

		තාක්ෂණ නිලධාරී (සිවිල්) තනතුර සඳහා බඳවා ගැනීමේ පටිපාටියක් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙතින් අනුමත කර ගෙන ඇත. කාර්යාල ගොඩනැගිල්ල අලුතින් ඉදිකර වසර 06ක පමණ කාලයක් ගතවී තිබූ අතර මෙතෙක් විශාල ලෙස අළුත්වැඩියාවන් හා නඩත්තු කටයුතු මතුවී නැති බැවින් තාක්ෂණ නිලධාරී (සිවිල්) නිලධාරියකුගේ සේවය අත්‍යාවශ්‍ය නොවීය. එබැවින් එම තනතුර සඳහා වැඩබැලීමේ පදනම මත නිලධාරියකු බඳවා ගැනීමට කටයුතු කර ඇත. තාක්ෂණ නිලධාරී (යාන්ත්‍රික) තනතුරට බඳවා ගැනීමට මෙතෙක් පියවර ගෙන නැති අතර දැනට මෙම තනතුරේ පූර්ණකාලීන සේවා අවශ්‍යතාවයක් නැති බවත් ඉදිරියේදී අවශ්‍යතාවය අනුව කටයුතු කරමි. භාෂා පරිවර්තක තනතුරේ පැවති පුරප්පාඩුවට අමතරව තවත් එක් නිලධාරියකු රා.ප.ච. 14/2022 යටතේ වැටුප් රහිත විදේශ නිවාඩු ලබා ගැනීම හේතුවෙන් තවත් පුරප්පාඩුවක් ඇති වී ඇති අතර එම පුරප්පාඩු 02 සම්බන්ධයෙන් ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත දන්වා එම පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට කටයුතු කරමි. **ද්විතීය මට්ටම -** තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර තනතුරෙහි පුරප්පාඩුව සහ කළමනාකරණ සේවා නිලධාරී තනතුරෙහි පුරප්පාඩු 1ක් ලෙස ද්විතීය මට්ටමේ මුළු පුරප්පාඩු 02ක් පැවතුනි. එම පුරප්පාඩු සඳහා නිලධාරීන් පත්කරන ලෙස ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙතින් ඉල්ලීම් කරන ලද අතර ඒ අනුව තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර තනතුර සඳහා නිලධාරියකු නව බඳවා ගැනීම් යටතේ අනුයුක්ත ඇත. ඒ අනුව එම පුරප්පාඩුව මේ වන විට සම්පූර්ණ කර ඇත. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 14/2022 හා අදාළ

		සංශෝධන යටතේ දේශීය/ විදේශීය වැටුප් රහිත නිවාඩු ලබා ගැනීම, සේවය හැරයාම, රාජ්‍ය සේවයේ වෙනත් තනතුරු සඳහා සේවයෙන් මුදාහැරීම් වැනි තත්වයන් හේතුවෙන් කළමනාකරණ සේවා නිලධාරී තනතුරෙහි මේ වන විට පුරප්පාඩු 11ක් ඇති වී ඇත. මෙම වසරේ මැයි මාසයේදී සිදුකිරීමට නියමිත නව කළමනාකරණ සේවා නිලධාරී බඳවා ගැනීම්වලදී එම පුරප්පාඩු සඳහා නිලධාරීන් අනුයුක්ත කරන ලෙස ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙතින් ඉල්ලීම් කරමින් ලිපි ඉදිරිපත් කර ඇත. කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීමට අනුමත තනතුරක් වන ලඝු ලේඛක තනතුරට අදාල කර්යයන් අනුමත කාර්ය මණ්ඩලයේ සිටින කළමනාරණ සේවා නිලධාරීන්ගෙන්ම තම රාජකාරීද සමග අවස්ථානුකූලව සිදුකරගනු ලැබේ. **ප්‍රාථමික මට්ටම -** රියදුරු සේවයේ පුරප්පාඩු 03 ක් හා කාර්යාල කාර්ය සේවයේ පුරප්පාඩු 03ක් ලෙස ප්‍රාථමික මට්ටමේ පුරප්පාඩු 06ක් 2023.12.31 වන විට ඇති වී තිබුණි. කාර්යාල සේවක සේවයේ පැවති පුරප්පාඩු 03ට අමතරව සීමිත පදනමත මත කළමනාකරණ සේවා නිලධාරී සේවයට උසස්වීම, රා.ප.ච. 14/2022 යටතේ විදේශ නිවාඩු ලබා ගැනීම හා සේවය අතහැර යාම වැනි හේතූන් නිසා ඇතිවූ පුරප්පාඩු 09ක් ද ඇතුළුව කාර්යාල කාර්ය සේවක සේවයේ මුළු පුරප්පාඩු 12ක් සම්පූර්ණ කිරීම සඳහා අග්‍රාමාත්‍ය ලේකම් කාර්යාලයේ පවත්වාගෙන යන රජයේ සේවයේ බඳවා ගැනීම් ක්‍රියාවලිය සමාලෝචන සඳහා වන කමිටුවෙන් ලබා ගත් අනුමැතිය මත සුදුසු නව නිලධාරීන් බඳවා ගෙන ඇත. රියදුරු සේවයේ පුරප්පාඩු 02ක් පමණක් මේ වන විට පවතින අතර එම පුරප්පාඩු සම්පූර්ණ කර දෙන ලෙස ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්

		වෙත ඉල්ලීම් කර ඇත. මෙම පුරප්පාඩු 02 රියදුරන් දෙදෙනෙකු විශ්‍රාම යැම හේතුවෙන් ඇති වූ බවත් වැඩිදුරටත් සඳහන් කරමි.
05	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රයේ Xi පරිච්ඡේදයේ 13.3 වගන්තිය අනුව පූර්ණ කාලීන සේවයක් අවශ්‍ය වන තනතුරකට නිත්‍ය පත්වීමක් සිදුකළ යුතු වීම සහ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ 2022 දෙසැම්බර් 14 දිනැති අංක 2310/29 දරන අති විශේෂ ගැසට් පත්‍ර මගින් පළකර තිබූ කාර්ය පටිපාටික රීති 139 වගන්තිය අනුව වැඩ බැලීමේ හෝ රාජකාරි ඉටුකිරීමේ පත්කිරීමක් වසරක උපරිම කාලයකට සීමාවිය යුතු බව දක්වා තිබුණද 2022 වර්ෂයේ විගණකාධිපති වාර්තාව අනුව එම නීති රීති වලට පටහැනිව කටයුතු කර තිබීම. ඒ අනුව, 2019 මාර්තු 01 දින සිට පුරප්පාඩුව පැවති කොමිෂන් සභාවේ පරිපාලන නිලධාරී තනතුර සඳහා විගණිත දිනය වූ 2023 මාර්තු 31 දින දක්වා එනම් වසර 4 ක කාලයක සිට වැඩ බැලීමේ පදනම මතද, 2021 දෙසැම්බර් 09 දින සිට පුරප්පාඩුව පැවති ලේකම් තනතුර සඳහා කොන්ත්‍රාත් පදනම මත හා වැඩ බැලීමේ පදනම මතද නිලධාරීන් පත්කර තිබුණි.	පරිපාලන නිලධාරී තනතුරේ පැවැති පුරප්පාඩුව සඳහා කළමනාකරණ සේවයේ අධිශ්‍රේණියේ නිලධාරියකු 2023.05.24 දින සිට ස්ථිරව පත් කර ඇත. ශ්‍රී ලංකා ප්‍රජාත්‍රතාන්තික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 56(4) ව්‍යවස්ථාව අනුව රාජ්‍ය සේවා කොමිෂන් සභාවට ලේකම්වරයකු පත්කර ගැනීම සඳහා කොමිෂන් සභාවට බලය ඇත. ඒ අනුව අයදුම්පත් කැඳවා සම්මුඛ පරීක්ෂණයක් පවත්වා 2023.08.02 දින සිට නව ලේකම්වරයකු ස්ථිරව පත්කර ගෙන ඇත.
06	**<u>2016 ජූලි 08 වැනි දින පැවති පූර්ව ගිණුම් කාරක සභා නියෝග ක්‍රියාත්මක කිරීම.</u>** **<u>නියෝග අංක 07</u>** 2010,2011 හා 2012 වර්ෂ සඳහා ක්‍රියාකාරී සැලසුම් සකස් කර නොමැති අතර 2016 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම සකස්කර ඇති බව කොමිෂන් සභාවේ ලේකම් විසින් ප්‍රකාශ කර තිබූ අතර වාර්ෂික ක්‍රියාකාරී සැලසුමට අනුව ප්‍රගති සමාලෝචනය හා ප්‍රගති වාර්තා	2025 වර්ෂය සඳහා සකස් කරන ලද ක්‍රියාකාරී සැලැස්ම අනුව 2025.12.31 දක්වා ප්‍රගතිය වාර්තා කර ඇත.

	කිරීම සිදුවිය යුතු බව. 2020 අගෝස්තු 28 දින නිකුත් කර තිබුණු අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 03 ඡේදය අනුව වාර්ෂිකව ක්‍රියාකාරී සැලැසුම් සකස්කර තිබුණ ද ක්‍රියාකාරී සැලැස්මේ ප්‍රගතිය දැක්වෙන ප්‍රගති වාර්තා පිළියෙල කර නොමැති බව කාරක සභාව නිරීක්ෂණය කළේය. ක්‍රියාකාරී සැලැස්මේ ප්‍රගතිය සෑම වසරකම සැප්තැම්බර් මස 30 වනදාට සකස් කරන බව ප්‍ර.ග.නි ප්‍රකාශ කළාය. කෙසේ වුවද, අමාත්‍යාංශ වලින් ලැබෙන පැමිණිලි විසඳීමේ ප්‍රගතිය, අදාළ ආයතන විසින් ඒ සඳහා ප්‍රතිචාර දැක්වීමේ ප්‍රමාණය මත තීරණය වන බැවින්, නිශ්චිතව දැක්විය නොහැකි බවත් ක්‍රියාකාරී සැලැස්මට අනුව ඉටු කරන ලද කාර්ය ප්‍රමාණය දළ වශයෙන් ප්‍රතිශතාත්මකව දක්වන බවත් වැඩිදුරටත් ප්‍රකාශ කළාය.	
07	<u>රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු</u> රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු සඳහා රාජ්‍ය පරිපාලන සේවයේ නිලධාරීන් පමණක් බඳවා නොගෙන ඒ සඳහා අනෙකුත් දිපව්‍යාප්ත සේවාවලින්ද නියෝජනයක් වන පරිදි නිලධාරීන් බඳවා ගත යුතු බවට කාරක සභාව නිර්දේශ කළේය. එවිට රාජ්‍ය සේවයේ විවිධ සේවාවන්/ක්ෂේත්‍රයන්හි නිලධාරීන් නියෝජනය වන පරිදි රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සංයුතිය සැකසීම තුළින් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත විවිධ ක්ෂේත්‍රයන්හි නිලධාරීන් විසින් යොමු කරනු ලබන පත්වීම් ලබාදීම හා උසස් කිරීම ආදී විවිධ ගැටළු සඳහා ප්‍රායෝගිකව සාර්ථක විසඳුම් ලබා දීමට හැකි වන බව ද කාරක	**PSC/ACC/R01/AUDIT/03/202** අංක හා **2024** පෙබරවාරි **22** දිනැති ලිපිය මගින් අදාල වාර්තාව ලබා දී ඇති අතර එම වාර්තාව මේ සමග ඉදිරිපත් කරමි. **(ඇමුණුම 02)**

	සභාව පෙන්වා දුන්නේය. මේ සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයේ පවතින ආයතනික ව්‍යුහය වෙනස් කළ යුතු බවද කාරක සභාව වැඩිදුරටත් යෝජනා කළේය. **නිර්දේශ** පසුගිය වර්ෂ 5හි රාජ්‍ය සේවයේ සියලුම සේවාවලින් ලැබෙන පැමිණිලි පිළිබඳව විශ්ලේෂණය කර/ වර්ගීකරණය කර ඒ පිළිබඳ සංඛ්‍යාලේඛණ සහිත වාර්තාවක් 2024.02.22 දිනට පෙර කාරක සභාව වෙත ලබා දෙන ලෙස කාරක සභාව ප්‍ර.ග.නි වෙත නිර්දේශ කළේය. **රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ගේ අංක PSC/ACC/R01/AUDIT/03/202 හා 2024 පෙබරවාරි 22 දිනැති ලිපිය මගින් එක් එක් වර්ෂ සඳහා අදාළ වාර්තා ලබා දී ඇත.**	
	රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් ලබා දෙන තීන්දු/ තීරණ වඩා සාධාරණ හා ඵලදායි කිරීම සඳහා දීපව්‍යාප්ත සේවා හා අනෙකුත් අදාළ සේවා වලින් නිලධාරී නියෝජනයක් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සේවක සංඛ්‍යාවට (Cadre) ඇතුළත් කර ගන්නා ලෙසත්, එසේ කළ නොහැකි නම් උපදේශක මට්ටමින් හෝ සියලු සේවාවන්ගේ නියෝජනයක් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ලබා ගැනීමට කටයුතු කරන ලෙසත් ඒ සඳහා අවශ්‍ය තනතුරු සංඛ්‍යාව පිළිබඳ මුදල්, ආර්ථික ස්ථායීකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව සමග සාකච්ඡා කර ඊට අදාළ යෝජනා පිළිබඳ 2024.01.31 දිනට පෙර කාරක සභාව වෙත වාර්තාවක් ලබාදෙන ලෙසත් කාරක සභාව ප්‍ර.ග.නි වෙත නිර්දේශ කළේය. **රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ගේ**	**PSC/ACC/R01/AUDIT/03/202 අංක දරණ 2024 පෙබරවාරි 22 දිනැති ලිපිය මගින් ඉදිරිපත් කර ඇත. එම වාර්තාව මේ සමග ඉදිරිපත් කරමි. (ඇමුණුම 03)**

	අංක **PSC/ACC/R01/AUDIT/03/202** හා **2024 පෙබරවාරි 22 දිනැති ලිපිය මගින් මෙම කරුණ සම්බන්ධව රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ පිළිතුරු දැක්වීම ලබා දී ඇත.**	
08	2017 ජුලි 25 දිනැති අංක 02/2017 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව කොමිෂන් සභාව තිරසර සංවර්ධන අරමුණු, ජාතික සංවර්ධන උපායමාර්ග සමග එක්ව පෙළ ගැස්වීම සිදු කළ යුතු වුවත් 2021 හා 2022 වර්ෂ වලට අදාළව පිළියෙල කර තිබුණු කාර්යසාධන වාර්තාවල තිරසර සංවර්ධන අරමුණු අදාළ නොවන බව දක්වා තිබුණි. මේ සම්බන්ධයෙන් නිකුත් කරන ලද විගණන වාර්තා සඳහා පිළිතුරු ලෙස කොමිෂන් සභාවට තිරසර සංවර්ධන අරමුණු අදාළ නොවන බව අවස්ථා කිහිපයකදීම දන්වා තිබුණ ද අදාළ චක්‍රලේඛ නිකුත් කර වසර 07 ක් ගත වීමෙන් පසු තිරසර සංවර්ධන අරමුණු 05 ක් 2024 වර්ෂයේදී හඳුනාගෙන තිබුණු බවත්, 2030 තිරසර සංවර්ධන න්‍යාය පත්‍රයේ සඳහන් අරමුණු කරා ළඟාවීමට මේ වන විට කටයුතු ආරම්භ කළ යුතු වුවද, එවැනි සැලසුමක් හා සූදානමක් තිබේද යන්න විගණනයට නිශ්චය කළ නොහැකි වී ඇති බවත් කාරක සභාව හමුවේ අනාවරණය විය. තිරසර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීම, සංවර්ධන වැඩසටහන් සහ දැනුවත් කිරීම් හා මහජන සේවාවන් පිළිබඳව ක්‍රියා කිරීමට රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කටයුතු කළ යුතු බව ද ඒ සඳහා ආයතනය තුළ අංශයක් ස්ථාපිත කර මෙම තිරසර සංවර්ධන අරමුණු සමාලෝචනය කර ආයතනයට අදාළ අරමුණු හඳුනාගෙන ඒ අනුව කටයුතු	කාරක සභාවේ දැණුම්දීම පරිදි 2024 වර්ෂයේ සිට තිරසර සංවර්ධන අරමුණු හඳුනා ගෙන එහි ප්‍රගතිය කාර්ය සාධන වාර්තාවට ඇතුලත් කර ඇත.

	කළ යුතු බව ද කාරක සභාව අවධාරණය කළේය. **නිර්දේශ**	
	i. සේවා ව්‍යවස්ථා අනුමත කිරීම හා බඳවා ගැනීමේ මාර්ගෝපදේශ සකස් කිරීමේදී කාලීනව සිදුකළ යුතු වෙනස්කම් හා වැඩිදියුණු කිරීම් පුරෝකථනය කර ඒ අනුව එම පටිපාටි සකස් කිරීමට හා ඒ සම්බන්ධ අධීක්ෂණයක් කිරීමට රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පියවර ගත යුතු බව මෙහිදී කාරක සභාව නිර්දේශ කළේය.	i 1. විද්‍යාත්මක, අධ්‍යාපන හා තාක්ෂණ සේවාවලට විශේෂඥතාව පදනම් කරගෙන උසස්වීම් මාර්ග හඳුන්වාදීමේ අවශ්‍යතාව හඳුනාගෙන ඊට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතියි. 2. ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ තෝරා ගැනීමේ ක්‍රමයෙහි වලංගුතාව ඉහළ නැංවීමට අවශ්‍ය පියවර හඳුනා ගෙන ඇත. 3. විද්‍යාත්මක, අධ්‍යාපන හා තාක්ෂණ සේවාවල දැනට පවත්නා කණ්ඩායම් වශයෙන් බඳවා ගැනීම් වෙනුවට තනතුරු පාදක බඳවා ගැනීමේ ක්‍රමයක් හඳුන්වා දීමේ හැකියාව පරීක්ෂා කෙරෙමින් පවතියි. 4. ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවය, ශ්‍රී ලංකා විදුහල්පති සේවය හා ශ්‍රී ලංකා ගුරු සේවයට බඳවා ගැනීමේ ක්‍රමවල සිදුවිය යුතු ප්‍රතිසංස්කරණ සම්බන්ධයෙන් අධ්‍යාපන අමාත්‍යාංශයේ අවධානය යොමු කරවා ඇත. 5. ශ්‍රී ලංකා විදේශ සේවයේ බඳවා ගැනීමේ ක්‍රමයේ සිදුවිය යුතු ප්‍රතිසංස්කරණ පිළිබඳව විදේශ අමාත්‍යාංශයේ අවධානයට යොමු කරවා ඇත. 6. දිප ව්‍යාප්ත සේවාවලට බඳවා ගැනීමේ හා එම සේවාවල උසස් කිරීම්වලදී අවශ්‍ය අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් සමාලෝචනය කිරීමට විශේෂඥ කමිටුවක් පිහිටුවීමට තීරණය කර ඇත.

	ii. එක් එක් ආයතන වලින් පසුගිය වසර 5 තුළ රාජ්‍ය සේවා කොමිෂන් සභාවට ලැබුණු පැමිණිලි විශ්ලේෂණය කර, රාජ්‍ය සේවය තුළ හඳුනා ගත් ප්‍රමුඛ ප්‍රශ්න පිළිබඳ වාර්තාවක් 2024.02.22 දිනට පෙර කාරක සභාව වෙත ලබාදෙන ලෙස කාරක සභාව ප්‍ර.ග.නි වෙත නිර්දේශ කළේය. **රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ගේ අංක PSC/ACC/R01/AUDIT/03/202 හා 2024 පෙබරවාරි 22 දිනැති ලිපිය මගින් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිරීක්ෂණ හා නිර්දේශ ඉදිරිපත් කර ඇත.**	**PSC/ACC/R01/AUDIT/03/202 අංක දරණ 2024 පෙබරවාරි 22 දිනැති ලිපිය මගින් ඉදිරිපත් කර ඇත. එම වාර්තාව මේ සමග ඉදිරිපත් කරමි. (ඇමුණුම 04)**
	iii. එක් එක් ආයතනවල බඳවා ගැනීම් අත්හිටුවමින් අධිකරණයෙන් ලබා දී ඇති තීන්දු (Stay Orders) පිළිබඳ වාර්තාවක් 2024.02.22 දිනට පෙර කාරක සභාවට ලබා දෙන ලෙස කාරක සභාව ප්‍ර.ග.නි වෙත නිර්දේශ කළේය. **රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ගේ අංක PSC/ACC/R01/AUDIT/03/202 හා 2024 පෙබරවාරි 22 දිනැති ලිපිය මගින් අදාළ වාර්තාව ලබා දී ඇත.**	**PSC/ACC/R01/AUDIT/03/202 අංක දරණ 2024 පෙබරවාරි 22 දිනැති ලිපිය මගින් ඉදිරිපත් කර ඇත. එම වාර්තාව මේ සමග ඉදිරිපත් කරමි. (ඇමුණුම 05)**
09	<u>රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත යොමු කරනු ලබන අභියාචන.</u> 2009 පෙබරවාරි 20 දිනැති අංක 1589/30 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍ර මගින් ප්‍රසිද්ධ කරන ලද රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීතීන්හි 237 වැනි වගන්තිය ප්‍රකාරව, කොමිෂන් සභාව වෙත යොමු කළ අභියාචනයක් කොමිෂන් සභාව	2022 දෙසැම්බර් 14 දිනැතිව නිකුත් කරන ලද අංක 2310/29 දරන කාර්ය පටිපාටික රීතින්ට අනුව කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරනු ලබන ස්ථාන මාරුවීම් සහ උසස්වීම්වලට අදාළ අභියාචනා සම්බන්ධයෙන් තීරණ ලබා දීමට නිශ්චිත කාල සීමාවක් සඳහන් කර නැත. එසේ වුවද කොමිෂන් සභාව වෙත ලැබෙන

	වෙත ලැබී, ස්ථාන මාරු සම්බන්ධයෙන් දින 15 ක් හා උසස් කිරීම් සම්බන්ධයෙන් දින 45 ක් ඇතුලත කොමිශන් සභාව විසින් තීරණයක් ගනු ලැබිය යුතු වේ. එසේ වුවත් පරීක්ෂා කරන ලද අභියාචන ලිපිගොනු 21 න් ස්ථානමාරු අභියාචනා 07 ක් සඳහා තීරණ ලබා දීමට දින 45 සිට දින 1,504 දක්වා කාලයක් ගත කර තිබුණු අතර එක් උසස් කිරීම් අභියාචනයක් ලැබී වසර 2 කට වා වැඩි කාලයක් ගතවී තිබුනද විගණිත දිනය වූ 2023 පෙබරවාරි 20 දින වන විටත් ඒ සඳහා තීරණයක් ලබා දී නොතිබුණි.	අභියාචනා සම්බන්ධයෙන් විධිමත් පරිදි වාර්තා කැඳවා, අභ්‍යන්තර ස්ථාවර නියෝග අනුව සිහිකැඳවීම් ලිපිද යොමු කරන බවද, වාර්තා ලැබී කෙටි කාලයක් ඇතුළත කොමිෂන් සභාව විසින් තීරණ ලබා දීමට කටයුතු සිදු කරනු ලැබේ.
10	<u>**විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ 12 වැනි වගන්තිය යටතේ විශ්‍රාම ගැන්වූ නිලධාරීන්.**</u> විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ 12 වැනි වගන්තිය යටතේ විශ්‍රාම ගැන්වූ නිලධාරීන් කොපමණද යන්න කොමිෂන් සභාවේ දත්ත පද්ධතිය මගින් ලබා ගැනීමේ පහසුකමක් නොතිබුණි. පරීක්ෂණයට භාජනය කළ ලිපිගොනු වලින් විනය පරීක්ෂණ ක්‍රියාමාර්ගවලට අදාල කටයුතු අවසන් කිරීමට වැඩි කාලයක් ගතවීම හේතුවෙන් ඇතැම් වූදිත නිලධාරීන්ට විශ්‍රාම වැටුප් හා අනෙකුත් විශ්‍රාම ප්‍රතිලාභ ලැබීම විනය පරීක්ෂණ කටයුතු අවසන් වී විනය නියෝග ලබා දෙන තෙක් වසර ගණනක් ප්‍රමාදවී තිබුණු අවස්ථාවන්ද කාරක සභාව විසින් නිරීක්ෂණය කළේය. ආයතන සංග්‍රහයේ ප්‍රතිපාදන අනුව මෙම විනය පරීක්ෂණ මණ්ඩලය පත් කර ඇති බව ද මෙම නිලධාරීන්ට විනය පරීක්ෂණ කටයුතු භාරදී නොමැත්තේ මේ වන තෙක් එවැනි අවස්ථා උදා නොවුණු නිසා බව ද ප්‍ර.ග.නි ප්‍රකාශ කළාය. නිලධාරීන් සම්බන්ධ විනය ගැටළු පිළිබඳ කටයුතු කිරීමේ දී කොමිශන් සභාව විසින්	රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති අනුමත කර ඇත්තේ රාජ්‍ය සේවා කොමිෂන් සභාව හා බලය අභිනියෝජිත පත්වීම්/විනය බලධාරීන් දෙපිරිසම සඳහාය. සිහිකැඳවීම් යැවීම රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයට පමණක් අදාල කටයුත්තකි. එබැවින් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය විසින් සිහිකැඳවීම් යැවීම පිළිබඳව අනුගමනය කල යුතු ආකාරය සම්බන්ධව ස්ථාවර නියෝග අනුමත කර ඇත.

	වෙනත් රජයේ ආයතන වෙතින් විටින් විට තොරතුරු කැඳවනු ලබන අතර, මෙලෙස කැඳවන තොරතුරු එම ආයතන විසින් ලබාදීමට ප්‍රමාද වන අවස්ථාවලදී සිහි කැඳවීම් ලිපි ද යවා තිබූ බවත්, එහෙත් මෙම සිහිකැඳවීම් යැවීම සියලුම ලිපිගොනුවලට පොදු වූ නිශ්චිත කාල සීමාවන් අනුව සිදු කර නොතිබුණු බව කාරක සභාව නිරීක්ෂණය කළේය. විනය ක්‍රියාමාර්ග ගැනීමේදී එහි එක් එක් පියවරයන් සඳහා ගතවන කාල සීමා එකිනෙකට වෙනස් වන බැවින් මෙලෙස සිහි කැඳවීමේ ලිපි යොමු කිරීමේ වෙනස් කාලසීමාවන් පවතින බව ප්‍ර.ග.නි ප්‍රකාශ කළාය. සිහිකැඳවීම් ලිපි යොමු කිරීම සියලුම ලිපිගානුවලට පොදු වූ නිශ්චිත කාල සීමාවන් අනුව සිදු කිරීමට අවශ්‍ය මාර්ගෝපදේශ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීති තුළට ඇතුළත් කිරීමට කටයුතු කළ යුතු බව කාරක සභාව අවධාරණය කළේය.	
11	<u>යාවත්කාලීන තොරතුරු ලබා ගැනීම සඳහා පරිගණක ජාලගත ලේඛන කළමනාකරණ පද්ධතිය යොදා ගැනීම.</u> කොමිෂන් සභාව විසින් නිර්මාණය කර තිබූ මෙම පද්ධතිය මගින් කාර්යාලය වෙත ලැබෙන ලිපියක / වර්තමාන තත්ත්වය (Present status) එනම් එය කුමන අංශයේ පවතින්නේද යන්න පරීක්ෂා කළ හැකිව තිබුණ නමුත් එකම ලිපිගොනුවකට අදාළව අවස්ථාවන් කිහිපයකදී ලැබෙන ලිපි සඳහා මෙම පද්ධතිය මගින් වෙන වෙනම අංකයන් ලබා දීම නිසා එම ලිපිගොනු වල ප්‍රගතිය මෙ මගින් පරීක්ෂා කළ නොහැකි වන බව කාරක සභාව හමුවේ අනාවරණය විය.	මෙම දත්ත පද්ධතිය සැදීමේ මූලික අරමුණ වූයේ කොමිෂන් සභාව වෙත ලැබෙන ලිපි සම්බන්ධයෙන් මූලික විස්තර ලෙස එම ලිපිය ලැබුණ දිනය හා වත්මන් තත්ත්වය දැනගැනීම වේ. දැනටමත් කොමිෂන් සභාව වෙත ලැබුන ලිපියක් සම්බන්ධව විමසීමේදී ඉතා සුළු කාලයකින් එහි වත්මන් තත්ත්වය මෙම දත්ත පද්ධතිය මගින් පහසුවෙන් සොයා ගැනීමට හැකියාව ඇත. එසේම කාල විශ්ලේෂණය ආදී තොරතුරු මෙම දත්ත පද්ධතිය මගින් ලබා ගැනීමට අපහසු බැවින් නව දත්ත පද්ධතියක්

	රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ දිනපතා ලැබෙන 200කට ආසන්න ලිපි කළමනාකරණය සඳහා 2012 වර්ෂයේදී සකස් කරන ලද මෙම පරිගණක ජාලගත ලේඛණ කළමනාකරණ පද්ධතිය මගින් අදාළ ලිපි ඒ ඒ දිනට කුමන අංශයේ පවතීද යන්න බලා ගැනීමට හැකි බව ප්‍ර.ග.නි ප්‍රකාශ කළාය. කෙසේවුවද, මෙම ජාලගත ලේඛණ කළමනාකරණ තොරතුරු පද්ධතිය තවදුරටත් වැඩිදියුණු කර වාර්තා ලබා ගැනීමට හැකි වන ලෙස සකස් කරන ලෙස කාරක සභාව මෙහිදී යෝජනා කළේය.	නිර්මාණය කිරීමට දැනටමත් මූලික කටයුතු සම්පාදනය කරමින් පවතින අතර එම දත්ත පද්ධතිය මගින් ඔබ පෙන්වා දෙන අවශ්‍යතාවයන් ඉටුකර ගැනීමට අපේක්ෂිතය.
12	**<u>2023 නොවැම්බර් 30 දිනට විගණනයට ලබා දුන් එක් එක් අංශයේ නිම කිරීමට පවතින ලිපිගොනුවල කාල විශ්ලේෂණය</u>** 2023 නොවැම්බර් 30 දිනට විගණනයට ලබා දුන් එක් එක් අංශයේ නිම කිරීමට පවතින ලිපිගොනුවල කාල විශ්ලේෂණය සහ විගණනය වෙත 2024 ජනවාරි 12 දින ලබාදුන් කොමිෂන් සභාවේ කටයුතු කරමින් පවතින ලිපිගොනු ලේඛනය අනුව පැවති ලිපිගොනු ආරම්භ කළ වර්ෂයන් පරීක්ෂා කිරීමේදී ඉහත ලබාදුන් කාල විශ්ලේෂණය නිවැරදි නොවන බව කාරක සභාව නිරීක්ෂණය කළේය. තවද, 2023 නොවැම්බර් 30 දිනට ලබා දුන් තොරතුරුවලට අනුව අභියාචනා අංශය, විනය අංශය හා උසස් කිරීම් අංශ සතුව කටයුතු කරගෙන යනු ලබන ගොනු සංඛ්‍යාව පිළිවෙලින් 292 ක්, 180 ක් හා 168 ක් වූ අතර එම සියලුම ගොනු වර්ෂයකට වඩා අඩු කාලයකට අදාළව වන බවත්, 2024 ජනවාරි 12 දින ලබාදුන් තොරතුරු අනුව අභියාචනා අංශය, විනය අංශය හා උසස් කිරීම් අංශවල කටයුතු කරමින් පවතින ගොනු පිළිවෙලින්	<u>අභියාචනා අංශය</u> අභියාචනා අංශයේ ගොනු එක් එක් කාරණාව අනුව පවත්වා ගෙන යන අතර කටයුතු කරමින් පවතින ගොනු සම්බන්ධයෙන් පරීක්ෂා කිරීමේදී ඒ අතර කාල විශ්ලේෂණය වසර 4ට වැඩි කාලයක් ගන්නා ගොනුද පවතින බව නිරීක්ෂණය වේ. අදාළ අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු වෙතින් කැඳවන ලද වාර්තා ලැබීමේ ප්‍රමාදය මත මෙම තත්ත්වය උද්ගතව ඇති බව පෙනී යන අතර අංශය විසින් නිරන්තර සිහිකැඳවීම් යොමු කර වාර්තා ගෙන්වා ගැනීමට කටයුතු කරයි. <u>විනය අංශය</u> නිලධාරීන් සම්බන්ධයෙන් විනයානුකූලව කටයුතු කිරීමේදී සිදුකරනු ලබන පහත සඳහන් ක්‍රියාමාර්ග පිළිබඳව ඔබගේ කාරුණික අවධානයට යොමු කරවමි. ආයතන සංග්‍රහයේ XLVIII පරිච්ඡේදයේ 13:12 වගන්තිය ප්‍රකාරව මූලික විමර්ශන

	247 ක්, 131 ක් හා 178 ක් වූ බව ද කාල විශ්ලේෂණය අනුව එම ගොනු වර්ෂ 1ට අඩු කාලයක සිට වර්ෂ 04ට වැඩි කාලයක් දක්වා පවතින බව ද කාරක සභාව නිරීක්ෂණය කළේය. අභියාචනා අංශයේ හා විනය අංශයේ ගොනු එක් එක් කාරණාව අනුව පවත්වාගෙන යන බැවින් කාල විශ්ලේෂණය වර්ෂ 4කට වැඩි විය හැකි වුවද උසස් වීමේ අංශයේ ආයතන වශයෙන් ගොනු වෙන්කර ඇති බැවින් ඉහත කාල විශ්ලේෂණයන් නිවැරදි නොවන බව අභියාචනා අංශයේ හා විනය අංශයේ ගොනු එක් එක් කාරණාව අනුව පවත්වායගන යන බැවින් කාල විශ්ලේෂණය වර්ෂ 4කට වැඩි විය හැකි වුවද උසස් වීමේ අංශයේ ආයතන වශයෙන් ගොනු වෙන් කර ඇති බැවින් ඉහත කාල විශ්ලේෂණයන් නිවැරදි නොවන බව ප්‍ර.ග.නි ප්‍රකාශ කළාය.	පැවැත්වීමෙන් අනතුරුව, මූලික විමර්ශන නිලධාරියාගේ නිරීක්ෂණ හා නිර්දේශ සහිත මූලික විමර්ශන වාර්තාව සමඟ අදාළ පාර්ශවයන් වෙතින් ලබා ගත් ප්‍රකාශ, ලිපි ලේඛන හා එම මූලික විමර්ශන මඟින් අනාවරණය වූ තොරතුරුවලට අනුව සැකයට පාත්‍ර වූ නිලධරයාට හෝ නිලධරයන්ට එරෙහිව විනයානුකූලව ක්‍රියා කිරීමට තරම් ප්‍රමාණවත් චෝදනාවන් හෙළිදරව් වන්නේ නම් ආයතන සංග්‍රහයේ 5 හා 6 පරිශිෂ්ඨ ප්‍රකාරව සකස්කල චෝදනා පත්‍ර කෙටුම්පත, එම මූලික විමර්ශනයේ නිරීක්ෂණ හා නිර්දේශ සම්බන්ධව අදාළ දොපාර්තමේන්තු ප්‍රධානීන් හා අමාත්‍යාංශ ලේකම්වරයාගේ හා පරිපාලන බලධාරියාගේ නිරීක්ෂණ හා නිර්දේශ සමඟ විනය බලධරයා වෙත ඉදිරිපත් කිරීම සිදුකල යුතු වුවත්, බොහෝ අවස්ථාවල එම කරුණු වාර්තා කරනුයේ අඩුපාඩු සහිතවය. එහිදී නැවත එම අඩුපාඩු කැඳවීමට සිදුවන අතර ඇතැම් අවස්ථාවලදී අදාල ලිපි ලේඛන සියල්ලද එම අඩුපාඩු සම්පූර්ණ කර එවීම සඳහා නැවත ආපසු යොමු කිරීමට සිදුවේ. එසේ සම්පූර්ණ කල යුතු අඩුපාඩු වෙන් වෙන් වශයෙන් සඳහන් කර යැව්වද එම අඩුපාඩු සම්පූර්ණ කර එවීමේදී ද නිසි පරිදි නොඑවීම හේතුවෙන් නැවත නැවතත් විමසීම් කිරීමට සිදුවේ. එබැවින් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත මූලික විමර්ශන වාර්තාවක් ඉදිරිපත් කිරීමේදී සැලකිලිමත් විය යුතු කරුණු සම්බන්ධව පිරික්සුම්පතක් සකස් කර මගේ අංක PSC/DIS/01/02/2022-02 හා 2022.04.25 දිනැති ලිපිය මඟින්, සියළු අමාත්‍යාංශ ලේකම්වරුන් වෙත හා දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත දැනුවත් කිරීමක් ද සිදුකර ඇති අතර, අදාළ තොරතුරු රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවියේ ප්‍රකාශයට පත්කර ඇත. තවද, චෝදනා පත්‍රය නිකුත් කිරීමෙන්

		පසුව එම චෝදනා පත්‍රය ලද නිලධාරියාට ඊට අදාළ පිළිතුරු ලබා දීම සඳහා මාස 01ක කාලයක් ලබාදෙයි. එහිදී ඔහු විසින් චෝදනා පත්‍රයට පිළිතුරු එවීම සඳහා අදාළ ලේඛන සපයා ගැනීමට අමතර කාල සීමා ඉල්ලුම් කරන අවස්ථාවලදී ද එසේ ඉදිරිපත් කරන කරුණු මත පිළිතුරු ලබාදීමේ කාලසීමාවන් දීර්ඝ කරනු ලැබේ. තවද, ආයතන සංග්‍රහයේ පවත්නා විධිවිධාන අනුව නිලධාරියා විසින් ඉදිරිපත් කරනු ලබන පිළිතුරු සඳහා අදාළ ආයතන ප්‍රධානීන් විසින් නිරීක්ෂණ නිර්දේශ හා අනෙකුත් තොරතුරු ඉදිරිපත් කල යුතු වේ. ඉන් අතුරුව නිලධාරියාගේ පිළිතුරුද දීර්ඝ ලෙස විශ්ලේෂණය කිරීමෙන් අනතුරුව ඒ සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණය ලබාදිය යුතු වේ. ඒ අනුව මෙකී කරුණු රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ පාලනය යටතේ පමණක් පවතින ක්‍රියාවලියක් ලෙස සැලකිය හැකි නොවේ. එසේම විධිමත් විනය පරීක්ෂණයක් ආරම්භ කිරීම සඳහා අවම වශයෙන් පාර්ශව 05ක් එනම්, පරීක්ෂණ නිලධාරී, පැමිණිල්ල මෙහෙයවන නිලධාරී, රැකවරණ නිලධාරී, චූදිත නිලධාරී හා සාක්ෂිකරුවන් සම්බන්ධ විය යුතු අතර, පරීක්ෂණය පැවැත්වෙන ස්ථානයේ ආයතන ප්‍රධාන විසින් ඊට අවශ්‍ය පහසුකම් සැපයීමද කළ යුතු වේ. එමෙන්ම චූදිත නිලධාරියා මෙන්ම දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින්ද පැමිණිල්ල මෙහෙයවීමේ නිලධරයා හා රැකවරණ නිලධරයා ලෙස කටයුතු කරන නිලධාරීන් සම්බන්ධ සංශෝධන ඉදිරිපත් කරන අවස්ථාවන්ද පවතී. එසේම ආයතන සංග්‍රහයේ විධි විධාන අනුව චෝදනා පත්‍ර සංශෝධනය

		සිදුකිරීම සඳහා ඉල්ලුම් කරන අවස්ථා පවතින අතර, එහිදී චෝදනා පත්‍ර සංශෝධනය කරන්නේ නම් ඒ සඳහා පිළිතුරු ලබාදීමටද නිලධාරියාට නැවත කාලයක් ලබාදිය යුතු වේ. එසේම එකී පිළිතුරු සඳහාද ආයතන ප්‍රධානීන් වෙතින් නිරීක්ෂණ නිර්දේශ ලබාගත යුතුවේ. තවද චූදිත නිලධාරීන් අත්අඩංගුවට ගැනීම් සිදුවී ඇති අවස්ථාවලදී ඔවුන් නිදහස් වන තුරු අදාළ පරීක්ෂණ කටයුතු තාවකාලිකව නතර කිරීමට සිදුවේ. එමෙන්ම, මෙකී කාර්යයන් සඳහා සම්බන්ධ වන නිලධාරීන්ට තම නිත්‍ය තනතුරේ රාජකාරිවලට ප්‍රමුඛතාවය ලබාදීමට සිදුවීම තුළින්ද ඒ සඳහා සහභාගී වීමේ ප්‍රමාදයන් සිදුවන බවත් ඒ අනුව විනය පරීක්ෂණ පැවැත්වීම ප්‍රමාද වන බවත් නිරීක්ෂණය වේ. චෝදනා පත්‍රයට ඇතුළත් සාක්ෂිකරුවන් සංඛ්‍යාව, ලේඛන සංඛ්‍යාව හා වරදේ පවතින සංකීර්ණභාවය යන හේතූන් නිසාද අදාළ චෝදනා සනාථ කිරීම සඳහා දීර්ඝ වශයෙන් සැසි පැවැත්වීමට සිදුවන බවද වැඩිදුරටත් නිරීක්ෂණය වේ. ඒ අනුව 2024 ජනවාරි 12 දින ලබාදුන් තොරතුරුවල ඇතුළත්ව තිබූ කටයුතු කරගෙන යනු ලැබූ ගොනු 131 අතුරින් මේ වන විට ගොනු 92ක කටයුතු අවසන් කර ඇති අතර, තවදුරටත් කටයුතු කරගෙන යනු ලබන ගොනු සංඛ්‍යාව 39ක් වන බව කාරුණිකව දන්වමි. <u>උසස්කිරීම් අංශය</u> උසස්කිරීම් අංශයට අදාල ගොනු එක් එක් කාරණාව අනුව පවත්වාගෙන යන ගොනු නොවන අතර, එය ආයතන/තනතුරු වශයෙන් වෙන්කර ඇත. එබැවින්, ලිපිගොනුව ආරම්භ කල වර්ෂය හා කටයුතු කරමින් පවතින ලිපියේ

		වර්ෂය වෙනස් විය හැක. එනම් එක් ගොනුවක් තුල අදාල ආයතනයේ/තනතුරේ වසර කිහිපයකට අදාල කාරණා පැවතිය හැක. උදා: 1. PSC/PRO/6/1046/2022 *ගොනුව ආරම්භ කල දිනය - 2022.05.04 *2024.01.12 දිනට කටයුතු කල ලිපියේ දිනය - 2023.12.15 *එම ලිපියේ කටයුතු අවසන් කල දිනය- 2024.01.29 2. PSC/PRO/6/1127/2023 *ගොනුව ආරම්භ කල දිනය - 2023.09.28 *2024.01.12 දිනට කටයුතු කල ලිපියේ දිනය - 2023.12.19 *එම ලිපියේ කටයුතු අවසන් කල දිනය- 2024.01.31

ඩබ්.එච්.එම්.එම්.සී.කේ. දයාරත්න

ලේකම්

රාජ්‍ය සේවා කොමිෂන් සභාව

ඩබ්ලිව්.එච්.එම්.එම්.සී.කේ. දයාරත්න
ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව
අංක 1200/9, රජමල්වත්ත පාර,
[illegible]